www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුද්ධයට එරෙහි අරගලය සහ 2004 එක්සත් ජනපද මැතිවරන

**The struggle against war and the 2004 US elections**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2004 අප්‍රේල් 27**

*අප්‍රේල් 17 දා ඈන් ආබර්හි මිචිගන් සරසවියේ පැවැත්වූ සසප මිඩ්වෙස්ට් සාමූහික රැස්වීමකට* ලෝක සමාජවාදී වෙබ් අඩවියෙහි *ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සභාපති හා එක්සත් ජනපද සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් වන ඩේවිඩ් නෝර්ත් ඉදිරිපත් කල වාර්තාව අපි පහත පල කරමු.*

සමාජවාදී සමානතා පක්ෂයේ ජනාධිපතිවරන උද්ඝෝෂනය පිලිබඳව සාකච්ඡා කිරීමට අප මෙහි, ඈන් ආබර්හි අවසාන වතාවට හමු වී යන්තම් මාසයක් ඉකුත්ව ඇත. 2004 මැතිවරනයන් තුල අපගේ මැදිහත් වීමේ දේශපාලනික හා ක්‍රියා මාර්ගික පදනම සමාලෝචනය කරමින් අපි මාර්තු 13 හා 14 යන දෙදින ගත කලෙමු. අප හමු වූ තැන් පටන් බොහෝ දේ සිදු වී ඇත -- සියල්ලට මත් වඩා, ඇමරිකාව ඉරාකය අල්ලා ගැනීමට එරෙහිව ඉරාකයෙහි නිර්ව්‍යාජ දේශ ව්‍යාප්ත කැරැල්ලක් පුපුරා යාම යි.

කැරැල්ල වූ කලි මැරයන්ගේ හෝ සදාම්වාදීන් සුලු පිරිසකගේ ක්‍රියාවකැයි වසයෙන් අපවාදයට ලක් කිරීමට මාධ්‍ය දරන සාහසික ප්‍රයත්නයන් නිරීක්ෂනය කල හැකි යථාර්ථයට පරම ප්‍රතිවිරුද්ධ තුච්ඡ බෙගල්වලින් සමන්විත ය. බෙහෙවින් ප්‍රාථමික ආයුධවලින් සන්නද්ධ සතුරන්ට එරෙහිව එක්සත් ජනපදය සිය යෝධ අවි යොදා ගත් සති තුනකට ආසන්න සටන් කාලයෙන් පසුව ද කැරැල්ල මැඩ පැවැත්වීමට ඇමරිකානු හමුදාවට නුපුලුවන් වී ඇත.

ඇමරිකානු හමුදාවට හා බුද්ධි අංශවලට ඉතා සමීප සබඳතා ඇති දක්ෂිනාංශික විශ්ලේෂක කන්ඩායමක් පවත්වා ගෙන යන *stratfor* වෙබ් අඩවිය මෑතක දී ඉරාකයේ යුදමය තත්වය පිලිබඳ විශ්ලේෂනයක් පල කල අතර සති එක හමාරකට පමන පෙර එය මෙසේ නිරීක්ෂනය කලේ ය:

''වර්තමාන ප්‍රවනතා වැඩි දියුනු වුව හොත්, ව්‍යසනයකට තුඩු දිය හැකි බරපතල මිලිටරි අභියෝගයකට එක්සත් ජනපදය මුහුන දෙන්නේ ය. පලල් පදනමක් සහිත ශියාවාදී නැගිටීම යටපත් කිරීමට මෙන්ම සුන්නි කැරැල්ල මැඩීමට ද අවශ්‍ය හමුදා බලය එක්සත් ජනපදයට නැත. නැගිටීමේ වර්තමාන භූගෝලීය ව්‍යාප්තිය පවා පවතින හමුදා කන්ඩායම්වල හෝ අලුතින් යොදනු විය හැකි හමුදා බලඇනිවල ප්‍රායෝගික සංඛ්‍යාවක අමතර හැකියාවන්ගෙන් හෝ ඔබ්බෙහි පවතී. එක්සත් ජනපදය දැනට මත් සමහර නගරවලින් ඉවත් වෙමින් සිටියි. මේ සියල්ලේ තර්කානුකූල ප්‍රතිඵලය වන්නේ එක්සත් ජනපදය සිය හමුදා -- සමහර විට ඉරාකීයයන් පලවා හැරි -- දැඩි ලෙස සුරක්ෂිත ස්ථාන කීපයකට සීමා කරමින් රටේ ඉතිරි කොටස ගරිල්ලන්ට අත හරිනු ඇති කොටු කල භූමි භාගයක මූලෝපායකි. සිය හමුදාවන්ට රට අභ්‍යන්තරයේ හෝ රටේ දේශ සීමාවෙන් පිටත හෝ ක්‍රියාත්මක බලයක් යෙදීමට නො හැකි තත්වය තුල එක්සත් ජනපදය ඉරාකය තුල රැඳී සිටීමට දුෂ්කර ප්‍රයත්නයක් දරන්නේ කුමක් නිසා ද යන ප්‍රශ්නය එමගින් පැන නංවයි.''

පසු ගිය සතිය තුල දී ව්‍යාකූල තත්වය තවත් ඉහල ගියේ ය. සැපයුම් මාර්ග ප්‍රහාරයට ලක් වන අතර ඉරාකයේ රඳවා සිටින හමුදාවන් විටින් විට අලුත් කිරීම අත්හිටුවීමට එක්සත් ජනපදය ගත් තීන්දුව හමුදාව අතිදුෂ්කර තත්වයකට මුහුන පා සිටින බවට වූ වැදගත් ඇඟවුමකි. වැඩිකල් නො ගොස් ම 2004 අප්‍රේල් මාසයේ දී මිලිටරිය මුහුන පෑ අන්තරායන් කෙතරම් බරපතල වී දැයි ඇඟවුම් කරන වාර්තාවන් ගෙන එනු ඇති බවට යමෙකුට නිශ්චිත විය හැකි ය යි මම සිතමි.

මාධ්‍යයෙහි ප්‍රතිචාරය වැදගත් වන අතර ම එය කල් තබා කිව හැකි ද වේ. වෙන කවර දාක හෝ නොවූ ප්‍රමානයකින් රුධිරය ඉල්ලා සිටීම් එහි පවතියි. මෙහි සුවිශේෂ ප්‍රකාශනය වන්නේ *වොෂින්ටන් පෝස්ට්* පුවත්පතේ ජෝර්ජ් විල් විසින් ලියනු ලැබූ තීරු ලිපි ගනනාවකි. පලමුව 2004 අප්‍රේල් 7 දා ඔහු මෙසේ ලිවී ය: ''පාලන තන්ත්‍රය වෙනස් කිරීම, අල්ලා ගැනීම, ජාතිය ගොඩ නැගීම -- නිශ්චිත වචනය අධිරාජ්‍යය යි -- වූ කලි ලෙයින් තෙත් වූ ව්‍යවසායකි. දැන් ඇමරිකානුවන් ඉරාකයේ නාගරික සටන්කාමීන් නිරායුධ කිරීමට හෝ පරාජය කිරීමට අවශ්‍ය ප්‍රචන්ඩත්වය සංවිධානය කිරීම සඳහා තෙමේ ම පන්නර ගැන්විය යුතු ය.'' සතියකට පසුව අප්‍රේල් 14 දා ඔහු මෙසේ ලිවී ය: ''ෆලුජාහි සිද්ධිවලින් පසුව නාවික භටයන්ගේ හා අනෙකුත් එක්සත් ජනපද බලඇනිවල ප්‍රථම රාජකාරිය වන්නේ ඔවුන්ගේ මූලික රාජකාරිය බව පැහැදිලි ය: එනම් මිනීමරු බලය යෙදීම යි.''

*වෝල් ස්ට්‍රීට් ජර්නලය* වසවිසෙහි සිය කොටසට දායක විය. ''අවසාන සටන ගැන යළි සිතා බැලීම'' යන මැයෙන් කතුවැකියක් පළ කරමින් එය ''ඇමරිකානු ජීවිත ආරක්ෂා කර ගැනීම'' සඳහා යොදා ගත හැකි ''අතිශය නිවැරදි, අඩු පරිමාවක් සහිත'' න්‍යෂ්ටික අවි වර්ධනය කරන ලෙස කියා සිටියේ ය. මෙය ඇමරිකානු ප්‍රභූවේ සමහර කොටස් තුළ පැතිර පවතින චින්තනය පිළිබඳ යම් හැඟීමක් ලබා දෙයි.

ෆලූජාහි ඉරාකීයයන් සිය ගනනින් මිය ගිය බව සැල ය. ගෙවී ගිය සති තුන තුළ රට පුරා කී දෙනකු මිය ගොස් ඇත් ද යන්න නො පැහැදිලි ය -- කිසිවකුත් මෙය ගනන් බලා නැත -- එහෙත් හානිය සැලකිය යුතු තරම් ඉතා මත් අධික සංඛ්‍යාවක් බව පැහැදිලි ය. එක්සත් ජනපදය ෆලූජාවට මිසයිල හා බෝම්බ හෙළීමට ගුවන් යානා භාවිත කරමින් සිටී.

මෙසේ විමසීම සුදුසු ය: 1940 ගනන්වල සිද්ධීන් එනම් ප්‍රන්සයෙහි, ඕලන්දයෙහි, පෝලන්තයෙහි හා සෝවියට් සංගමයේ පාලනයට නතු වූ කොටස්වල පැන නැගි විරෝධතාවන්ට එරෙහිව නාසීන් ගෙන ගිය පාක්ෂික සටන්කරුවන්ට වෙඩි තැබීම හා වෝර්සෝ නැගිටීම මැඩ පැවැත්වීම බඳු පළි ගැනීමේ ප්‍රහාරයන් යළි සිහිපත් නො කරන්නා වූ කිසිවක් ඉරාකයේ සිදුවෙමින් පවතී ද?

චෙකොස්ලෝවැකියාවේ දී පාක්ෂික සටන්කරුවන් ප්‍රාග්හි දී නාසි නායක රෙයින්හාඩ් හෙයිඩ්‍රිච් ඝාතනය කිරීමට සමත් වූ විට -- මොහු ඉරාකයේ එක්සත් ජනපද විජිත පාලක පෝල් බ්‍රෙමර්ට සමාන නිලධරයෙකි -- ෆැසිස්ට්වාදීන්ගේ ප්‍රතිචාරය වූයේ ලිඩිස් නගරය විනාශ කිරීම ද ඇතුළත් දැවැන්ත පළි ගැනීමේ ක්‍රියාවලියකි.

යුද්ධය එක්සත් ජනපදය මත දැඩි බලපෑමක් ඇති කරමින් තිබේ. ඉරාකය අල්ලා ගැනීම සැලසුම් කළ, ඊට සහයෝගය දුන් හා ඉන් ඵලප්‍රයෝජන ලැබූවන් ද ඊට විරුද්ධ වූ කොටස් ද අතර ගැඹුරු හා සමහන් නො කළ හැකි අගාධයක් විවර වෙමින් පවතී. දැනට මත් සදාචාරමය ධ්‍රැවාන්තගත වීමක් සිදු වෙයි. අවසාන විග්‍රහයේ දී එකිනෙකට ප්‍රතිපක්ෂ පන්ති උවමනාකම් තුළ මුල් බැස පවත්නා මෙකී සාරභූත බෙදීම් තුළින් අනාගතයේ කටුක හා පුපුරනසුලු සමාජ අරගලයන් පූර්වාපේක්ෂා කෙරේ. මෙම යුද්ධයේ සංවිධායකයන් හා ඔවුන්ගේ ක්ෂමාලාපකයන් සමග පොදු එකඟතාවකට හැකියාවක් නොමැත. ඔවුන් පැළපදියම්ව ඇත්තේ වෙනස් වූ සදාචාරමය විශ්වයක ය.

කෙසේ වෙතත් අප අද මෙතැන සිටින්නේ සදාචාරය ගැන සාකච්ඡා කිරීමට නො ව දේශපාලනය ගැන කතා කිරීමට ය. අපගේ විශේෂ උනන්දුව යොමු වන්නේ මසකට පෙර අප හමු වූ තැන් පටන් දිග හැරී තිබෙන මෙම වර්ධනයන් කෙරෙහි ඩිමොක්‍රැටික් පක්ෂයේ ප්‍රතිචාරය ගැන ය. අප අපේක්ෂා කළ පරිදි ඩිමොක්‍රැටික් පක්ෂය ඉරාක යුද්ධයට ඇති විරුද්ධත්වය සමග මොන ම ඇයිහොඳැයියක් හෝ ප්‍රතික්ෂේප කිරීම පරිසමාප්තියකට ගෙනැවිත් තිබේ.

පසු ගිය මාසයේ අප හමු වූ විට දී කම්කරු පන්තිය ධනේශ්වර ද්වි-පක්ෂ ක්‍රමයෙන් දේශපාලනිකව බිඳී වෙන් වීමේ අවශ්‍යතාව අපි අවධාරනය කළෙමු. සම්මේලනයට කලින් සූදානම් කළ අපගේ මැතිවරන ප්‍රකාශනයේ කෙටුම්පත ද සම්මේලනයේ ආරම්භක වාර්තාව ද අවධාරනය කළේ, 2004 මැතිවරනයේ දී සියල්ලට ඉහළින් ඇති කාරනය වනුයේ ජනාධිපති බුෂ් පරාජය කිරීම ය යන තර්කය ද දේශපාලන මූලධර්ම හා ක්‍රියා මාර්ගය පිළිබඳ සකලවිධ ප්‍රශ්න වඩාත් ග්‍රාම්‍ය වූත් තත්කාර්යවාදී වූත් මැතිවරන ගනන් බැලීම්වලට යටත් කළ යුතු ය යන තර්කය ද සසපය ප්‍රතික්ෂේප කරන බව ය.

හොවාඩ් ඩීන්ගේ උද්ඝෝෂනය පීළි පැන තිබීමත් ජෝන් කෙරීගේ නාම යෝජනාව සුරක්ෂිත වීමත් සිදු කෙරුනු ආකාරය මගින් ඒ වන විට මත් මෙම තර්කවල බංකොලොත් භාවය අනාවරනය වී තිබුනි. පසු ගිය මාසයේ පැවති සම්මේලනයේ ආරම්භක වාර්තාව පැහැදිලි කළේ පාලක ප්‍රභූව, සියල්ලට ම පළමු ව, මෙම ජනාධිපතිවරනය මොන යම් තත්වයක් යටතේ වත් ඉරාකයේ ආක්‍රමනකාරී ග්‍රහනය පිළිබඳ ජනමත විචාරනයක් බවට පත් වීමට ඉඩ නො දෙන බවට අධිෂ්ඨාන කොට සිටින බව ය.

මගේ ම වාර්තාවෙන් උපුටා දැක්වීමට මට අවසර ලැබෙන්නේ නම්: ''ඔහු (ඩීන්) පද්ධතියට කිසිදු දේශපාලන තර්ජනයක් එල්ල නො කරන තරයේ ම සංස්ථිතිකවාදියෙකු වුව ද ඔහුගේ අපේක්ෂකත්වය මෙම මැතිවරනය ඉරාක යුද්ධය පිළිබඳ ජනමතවරනයක් ලෙසින් ලොව පුරා දැක ගනු ලැබීමේ හැකියාව විවර කළේ ය. මෙය ඇමරිකානු අධිරාජ්‍යවාදයේ උවමනාවන් කෙරෙහි දුරදිග යන, භයානක ඇඟවුම් සහිත ය.... ගැටලුව වූයේ ඩීන්ගේ අභිප්‍රායන් නො වේ. එක්සත් ජනපදය තුළත් ජාත්‍යන්තරවත් ඉරාකයේ ඇමරිකානු ආක්‍රමනකාරී ග්‍රහනය පිළිබඳව වන විරුද්ධත්වයක් ඔහුගේ අපේක්ෂකත්වය මගින් නීතියුක්ත හා දිරිමත් වනු ඇතැයි යන අන්තරාය එතුළ පැවතීම යි.''

ප්‍රාථමික ඡන්ද ව්‍යාපාරයේ සමස්ත ක්‍රියාවලිය ම යොමු වූයේ මැතිවරන ව්‍යාපාරය තුළ දී යුද්ධයට හා ඉරාකයේ ආක්‍රමනකාරී ග්‍රහනය වෙතට විරුද්ධත්වයක් යොමු නො වීම සඳහා වග බලා ගැනීමට ය. එය ඒ තරම් අවශ්‍ය වූයේ මන්ද යන්න ඇතැම් විට මාසයකට පෙර දීට වඩා අද පැහැදිලි ය. 2003-2004 ශීත හා හේමන්ත ඍතුවල දේශපාලන ක්‍රියාවලිය මුලුමනින් ම වාගේ යුද විරෝධී මනෝගතියකින් ඇවිළී ගොස් තිබුනේ වී නමුදු, යුද්ධයේ විවෘත ආධාරකරුවෙකු ලෙස තමා ම සලකා ගත් අපේක්ෂකයා -- සෙනෙට් සභික ජෝසප් ලිබර්මාන් -- සියලු ඩිමොක්‍රැටික් අපේක්ෂකයන් අතුරින් වඩාත් මහජන අප්‍රසාදයට බඳුන් වූ පුද්ගලයා විය, සන්තතියේ අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ සමස්ත යුද විරෝධී ඡන්ද දායකත්වයේ ම ඡන්ද බලය මුලුමනින් ම අහිමි කරනු ලැබීම ය.

ජන මත විමසුම් නිල වසයෙන් පෙන්නුම් කරනුයේ එක්සත් ජනපදයේ ජනගහනයෙන් හරි අඩකට කිට්ටු සංඛ්‍යාවක් යුද්ධයට විවෘත ලෙස ම විරුද්ධ බව ය. එහෙත් වෙන කිසිවක් නො වේ නම් සිය පරිපූර්න ප්‍රජාතන්ත්‍රීය නො වන ස්වභාවය පෙන්නුම් කරන පවතින ද්වි-පක්ෂ ක්‍රමය අනුයන දේශපාලනය තුල මෙම විරුද්ධත්වය මොන යම් හෝ ප්‍රකාශනයක් අත්පත් කර නො ගනී.

ඩිමොක්‍රැටික් පක්ෂයේ අනුමාන කල හැකි ජනාධිපති අපේක්ෂකයා බවට ජෝන් කෙරී පත් වූ තැන් සිට ඔහු පෙරට ගෙනෙන ආස්ථාන දෙස අපි බලමු. මාර්තුවේ දී *වොෂින්ටන් පෝස්ට්* පුවත්පත ඉරාකයේ ආක්‍රමනකාරී ග්‍රහනය කෙරෙහි ඇති විරුද්ධත්වය සමග තමා කිසිදු සම්බන්ධයක් තබා නො ගන්නා බවට ප්‍රකාශ කල යුතු යැයි ඔහුට අභියෝග කලේ ය. ඔහු මෙම අභියෝගයට ප්‍රතිචාර දැක්වූයේ අප්‍රේල් 13 දා *වොෂින්ටන් පෝස්ට්* පුවත්පතෙහි ප්‍රකාශයක් පල කරවීමෙනි. එහි ඔහු මෙලෙස සඳහන් කලේ ය:

‘‘අප යුද්ධයට ගියේ කෙසේ ද යන්න ගැන අප අතර වෙනස්කම් තිබිය හැකි අතරේ ම සියලු දේශපාලන පෙලඹීම්වලින් යුත් ඇමරිකානුවෝ ජයග්‍රහනයෙහි ලා ඔවුන්ගේ අධිෂ්ඨානශීලී භාවයෙන් එක්සත්ව සිටිති. අපේ හමුදාවන්ට ප්‍රහාර එල්ල කරන අන්තවාදීහු, ඔවුන්ට ඇමරිකාව බෙදා ලීමේ කටයුත්ත හෝ ඇමරිකානු අධිෂ්ඨානය පිරිහෙලීම හෝ ඇමරිකානු හමුදා නියම කලට පෙර ඉවත් කර ගැනීමට බල කිරීම හෝ සාර්ථක කර ගත නො හැකි බව දැන ගත යුතු වෙති. ඉරාකයේ ස්ථාවර, සාමකාමී හා බහුජන සමාජයක් ගොඩ නැගුමට ඉරාකීයයන්ට ආධාර කිරීමට අප රට බැඳී සිටී. නොවැම්බරයේ කවුරුන් ජනාධිපති වුව ද අපි එම මෙහෙවර ආරක්ෂා කරන්නෙමු. එහෙත් ජයග්‍රහනය සඳහා අපට ඇති අවස්ථා උපරිම කර ගැනීමටත් අසාර්ථකත්වයේ අන්තරායන් අවම කර ගැනීමටත් ඒ සඳහා අප සතුව ඇති සම්පත්වල සම්පූර්න ප්‍රයෝජනය අපි ගත යුත්තෙමු. අපේ හමුදා අන දෙන්නන් තවත් බලඇනි ඉල්ලා සිටින්නේ නම් අපි බලඇනි ලබා දිය යුතු වෙමු.’’

මෙයට වඩා පැහැදිලි විය හැකි කිසිවක් තිබිය නො හැකි ය. කෙරීට සහයෝගය දක්වන්නන්ට, මෙම මැතිවරනයේ මූලික ප්‍රශ්නය හුදෙක් බුෂ් පරාජය කිරීම යැයි තර්ක කරන්නන්ට ඔවුන්ගේ ඉදිරි දර්ශනය සාර්ථක වුව ද මේ දේශපාලන පිලිවෙතෙහි ප්‍රතිඵලයෙන් අප මවිතයට පත් වූවා ය යි කිය පෑමට නො හැකි ය. කෙරී දැන් පැහැදිලිව ඉදිරිපත් කරන ආස්ථානවලට -- යුද්ධය හා ඉරාකයේ ආක්‍රමනකාරී ග්‍රහනය එක්සත් ජනපදයේ ජාතික උවමනාවක, මෙම යුද්ධයට සහාය දැක්විය යුතු ය, එම රට තුල ප්‍රතිරෝධය මැඩීම සඳහා මිලිටරියට අවශ්‍ය වන විට හමුදා සේනාංක සැපයිය යුතු ය -- ඔවුහු බැඳී සිටිති.

පාලක ප්‍රභුව මෙම මැතිවරනය සිය භූගෝලීය මූලෝපාය තියුනු කිරීමෙන් සිය උවමනාවන් සුරක්ෂිත කිරීමට අවශ්‍ය යැයි ඔවුන්ට හැඟෙන ඇතැම් විට ධවල මන්දිරයේ වර්තමාන මූලිකයා ප්‍රතිස්ථාපනය කිරීම ද ඇතුලත් උපායික සැකසුම් ඉදිරියට ගෙන යාමේත් මාධ්‍යයක් ලෙස දකියි. බුෂ් පරිපාලනයේ දුබලත්වය ද එය කෙරෙහි පල වන මහජන අප්‍රසාදය ද එහි අභ්‍යන්තර බෙදීම් තියුනු වීම ද මෙම පරිපාලනයේ කටයුතු කෙරෙහි ප්‍රභූර්ව තුල අතෘප්තිය තීව්‍ර වීම ද ක්‍රමයෙන් ඉහල යත් ම කෙරී පිලිගත හැකි විකල්පයක් සේ දැක ගත හැකි වීමට පුලුවන. ධවල මන්දිරයට ඇතුලු වීම සඳහා ගෙවිය යුතු මිල වන්නේ ඉරාක ආක්‍රමනයට හා ඉරාකය ග්‍රහනයෙහි තබා ගැනීමට දක්වන පැහැදිලි සහයෝගය යි.

මෙම යුද්ධය දිගට ම ගෙන යාම ඇමරිකානු ජනතාව අපේක්ෂා කරන හෝ භාර ගැනීමට සූදානම් වන හෝ ප්‍රමානයට වඩා බෙහෙවින් විශාල මුදල් සම්භාරයක් ද ජීවිත ප්‍රමානයක් ද වැය වීමට හේතු වන බව පාලක පන්තිය හොඳාකාරව දනී. ඩිමොක්‍රැටික් පක්ෂය අධිරාජ්‍යවාදී දේශපාලනයට වංචනික-ප්‍රගතිශීලී ලිබරල් පෙනුමක් දෙමින් කරලියට එන්නේ හරියට ම මේ තත්වය තුල ය.

කෙරීගේ උද්ඝෝෂනය සුවිශේෂිතව ම කේන්ද්‍රගතව ඇත්තේ ඔවුන්ට අවශ්‍ය මිනිසා තමා බව පාලක පන්තියට ඒත්තු ගැන්වීමට ය. ප්‍රාථමික ඡන්ද ව්‍යාපාරය තුල දී ඩීන්ට විරුද්ධව කැපී පෙනෙන ලෙස නැගී එන ආකාරයෙන් තමන් වපුරා තිබූ යුද විරෝධී ප්‍රතිරූපය ඩිමොක්‍රටික් පක්ෂ අපේක්ෂකත්වය තමන්ට හිමි වනු ඇතැයි බලාපොරොත්තු ඉහල නැංවෙන තත්වයේ දී ඔහු මුලුමනින් ම ඉවත දමා ඇත. දැන් ඔහු පාලක පන්තියේ ‘‘හදවත හා මනස’’ දිනා ගැනීමට සටන් වැද සිටියි.

සෑම ඇමරිකානුවෙකු ම මෙම යුද්ධයේ ජයග්‍රහනය හා ඉරාකය යටත් කර තබා ගැනීම ඇලුම් කරති යි කෙරී පවසන විට එහි ඉමහත් දේශපාලනික වැදගත්කමක් තිබේ. එය සරල කෙප්පයක් නො වේ. එක්සත් ජනපදයේ නිල දේශපාලනය ලෙස සලකනු ලබන දැයින් යුද්ධ විරෝධී දේශපාලනය ඉවත් කර තැබීම එහි අර්ථය යි. එවන් ප්‍රකාශනයන් දෙස බැලිය යුත්තේ යුද්ධයේ දේශපාලනික ඇඟවීම්වල සන්දර්භය තුල තබා ය.

එක්සත් ජනපදය යුද්ධයට කඩා පනින විට බුෂ් පරිපාලනය වත් ඩිමොක්‍රැටිකයන් වත් මාධ්‍ය වෙතින් වත් මෙම නො බැරෑරුම් තීන්දුවේ ඵලවිපාක පෙර නො දුටුවෝ ය. එහෙත් සිද්ධීන් දිග හැරෙමින් ඇත්තේ අධිරාජ්‍යවාදී යුද්ධයේ ලේ වැකි තර්කනයට අනුරූපව ය. ඉරාකය තුල, යටත් කර ගැනීමේ සාර්ථකත්වය ඉරාකයේ මෙන් ම මැදපෙරදිග ද මහජනතාවන්ට එරෙහි පෙර නො වූ විරූ මට්ටමක ප්‍රචන්ඩත්වයක් ඉල්ලා සිටී. එක්සත් ජනපදය තුල, මෙම යුද්ධය ඉදිරියට ගෙන යාමට අවශ්‍ය මානව සම්පත් හමුදාවට වඩ වඩාත් මිනිසුන් බඳවා ගැනීමෙන් තොරව සොයා ගත

නො හැකි වනු ඇත. එහි තේරුම වන්නේ ම කෙටුම්පත යලි හඳුන්වා දීම යි.

කෙටුම්පත සඳහා මහජනයා සූදානම් කිරීමට හැම තැනක ම පෙරහුරු බැලුන උඩට යවනු ලැබේ. අප්‍රේල් 11 දා *නිව් යෝක් ටයිම්ස්* පුවත්පත මෙසේ ලිවී ය: ''ඇමරිකානුවන් කැප කිරීමේ අවශ්‍යතාව වටහා ගන්නේ නම් බුෂ්ට කෙටුම්පත මගින් බරපතල ලෙස දුර්වල මිලිටරියට රුකුල් දීම පවා කල හැකි ය.''

පහත දැක්වෙන ඡේදය අඩංගු කතුවැකියක් අද *වොෂින්ටන් පෝස්ට්* පුවත්පතෙහි පල වේ. මිලිටරිය පත්ව සිටින දුෂ්කරතාව ගැන සැලකිලිමත් වෙමින් එය මෙසේ ලියයි: ''2001 සැප්තැම්බර් 11 දා ත්‍රස්තවාදයට එරෙහි භූගෝලීය යුද්ධයකට පරිපාලනය ඇතුලු වූ මුත් ඊට අනුරූපව හමුදා බලඇනිවල ප්‍රමානයන් සකස් කර ගෙන නැත. ලෝක සිද්ධීන් මගින් සක්‍රීය හා අමතර හමුදා කැඳවීමට බුෂ් පාලනය පොලඹවන්නේ වත්මන් මඳ වේගයෙන් නම් බඳවා ගැනීම් හා රඳවා ගැනීම් අර්බුදයකට යනු ඇති අතර, පසු ගිය අවුරුදු කීපය මුලුල්ලේ කීප වාරයක් ඔප්පු කෙරී ඇති ආකාරයට හානිදායක විය හැකි ය. ඉරාකයෙහි මෙන් ම භයානක වූ ලෝකය පුරා තිබිය යුතු හමුදා අවශ්‍යතා පිලිබඳව ද එලඹෙන වසරවල වඩාත් සාධාරන ලෙස රට මේ තත්වයට මූන දෙන්නේ කෙසේ ද යන්න පිලිබඳව ද බරපතල ලෙස සිතිය යුතු කාලය එලඹ ඇත.''

මෙහි අර්ථය හොඳට ම පැහැදිලි ය: කෙටුම්පත යලිත් ඉදිරිපත් වෙමින් තිබේ. ''තේරීම් සේවා ආයතනය'' වෙබ් අඩවියෙහි පල කර තිබුනු දැන්වීම කෙරෙහි අවධානය යොමු කල යුතු වෙයි. ඉන් කියැවුනේ දැනට කෙටුම්පත යලි හඳුන්වාදීමේ කිසිදු සැලැස්මක් නැති අතර වයස අවුරුදු 18ට වැඩි සියලු ඇමරිකානුවන් ලියාපදිංචි කිරීම තමන් දිගට ම කර ගෙන යන බව යි; තව ද යම් හෙයකින් කෙටුම්පත ක්‍රියාවට නැගීම අවශ්‍ය වුව හොත් අවශ්‍ය පරිදි ක්‍රියාත්මක වීම සඳහා ඕනෑ ම දෙයක් ඉටු කිරීමට තේරීම් සේවාව සූදානම් කෙරෙන බව යි.

මෙම සන්දර්භයට මම මෙය ද එකතු කරමි. ඩික් චෙනී හා බුෂ් පරිපාලනයේ අනෙකුත් උසස් මට්ටමේ නිලධාරීන් මිලිටරියේ සේවයේ නො යෙදීමේ කරුන රිපබ්ලිකන්වරුනට එරෙහි ප්‍රහාරයක තුඩ වසයෙන් මතු කිරීමට කෙරී තීරනය කිරීම, හුදෙක් මැතිවරන අභ්‍යාසයක් පමනක් ම ය යි මම නො සිතමි. අපට ලැබෙමින් පවතිනුයේ කෙටුම්පත දිරිගන්වන, යුද්ධයට දෙන සහයෝගය සමග සම්බන්ධිත නව දේශප්‍රේමීත්වයක් හා මෙම ''ප්‍රයෝජනවත් කර්තව්‍යයෙහි'' කොටස්කරුවන් ලෙස සහභාගි වන මෙන් සියල්ලන් වෙත කරන කැඳවුමකි.

කෙටුම්පතට සහයෝගය ගොනු කරන මහජන උද්ඝෝෂනය සඳහා දෘෂ්ටිවාදාත්මක පදනම සැකසෙමින් තිබේ. නිදසුනක් වසයෙන්, වසර ගනනකට පෙර වියට්නාම් යුද්ධයට විරුද්ධ වූ, එහෙත් එතැන් පටන් මිලිටරිවාදයේ චමත්කාරය අනාවරනය කර ගෙන ඇති පෝල් බර්මාන් ඉරාක ආක්‍රමනය නීතියුක්ත කිරීමට ප්‍රයත්න දරන්නා වූ ද ''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය'' නීත්‍යනුකූල හා ඉස්ලාම් සර්වබලාධිකාරිත්වයට එරෙහිව අවශ්‍ය අරගලයකි යි ප්‍රකාශ කරන්නා වූ ද කෘතියක් ලියා ඇත. සාහසික නව-අධිරාජ්‍යවාදී පිලිවෙතක් උදෙසා පදනමක් සම්පාදනය කිරීම උසි ගන්වන බුද්ධිමය වසයෙන් වඳ හා වංක තර්කනයන්ගේ ස්වරූපය එබඳු ය.

මේවා අහම්බ වර්ධනයන් නො වේ. බුෂ් පරිපාලනය සමග එහි උපායාත්මක වෙනස්කම් කෙතරම් බරපතල වුව ද, ඩිමොක්‍රැටික් පක්ෂය දැස් යොමු කරන්නේ ද රිපබ්ලිකන්වරුන්ගේ මූල්‍යමය හා පන්ති උවමනාකම්වලින් අතිමූලිකව වෙනස් නො වූ එම මූල්‍යමය හා පන්ති අවශ්‍යතාවන් ම සහිත සමාජ ස්තරයක් දෙසට ය. ඩිමොක්‍රැටික් පක්ෂයේ වඩාත් සමීපතම සමාජ පදනම සමන්විතව ඇත්තේ එක්සත් ජනපදය ගෙන යන ආර්ථික පිලිවෙත්වලින් ද්‍රව්‍යමය වාසි ලබන පාලක ප්‍රභූවේ කොටස් හා ඉහල වැටුප් ලබන වෘත්තිකයන්ගේ ධනවත් ම ස්තරයෙනි.

මෑත දශකයන් අංගලක්ෂිතව ඇත්තේ ලාභ වෙලඳ භාන්ඩ හා පහල වැටෙන වැටුප් මට්ටම් ද කම්කරු ජනතාව සුපිරි සූරා කෑමට ලක් කරන තත්වයන් ද පවත්වා ගෙන යාම මගින් අත් කර ගන්නා වූ නිෂ්පාදන බලවේගවල සැබෑ වර්ධනයක් මගින් නො වේ, ඒ වෙනුවට පසුගිය 20 වසර තුල වැඩි ආ පාලක ප්‍රභූවේ කොටස්වලට හා අසීමිත ධන සමුච්චයක් රැස් කර ගත් කොටස්වලට අවශ්‍ය ද්‍රව්‍යමය පදනම මෙයින් සම්පාදනය කෙරුනි.

පසු ගිය මාසය තුල ඇති වූ ඉතා ශීඝ්‍ර වර්ධනයන් -- ඉරාක ආක්‍රමනකාරී ග්‍රහනය කෙරෙහි වන විරෝධතාව මගින් ජනිත ඉරාක යුද්ධය ද සමග ඩිමොක්‍රැටික් පක්ෂය මෙම ප්‍රශ්න සම්බන්ධයෙන් තමන් දරන තැන අර්ථ ගැන්වූ අසාමාන්‍ය වේගය ආදිය -- මෙම වසරේ සිද්ධීන් කෙතරම් පුපුරනසුලු ආකාරයකට සිදු වන්නට යන්නේ ද යන්න පිලිබඳව දැක්වෙන බරපතල සංඥාවක් ලෙස ගත යුතු ය. අප තව මත් සිටින්නේ මැතිවරනයෙන් මාස හතකට මෙහායින් බව සිත තබා ගන්න.

දේශපාලන වාතාවරනයේ මාරු වීමක් හා පූර්ව විප්ලවවාදී තත්වයක් පැන නැගීම දේශපාලන සවිඥානකත්වයේ තැති ගන්නාසුලු ප්‍රතිචාරයක් නිර්මානය කරන වර්ධනයකි. ශරත් හා සිසිර ඍතු පුරා, යුද්ධයට විරුද්ධ බොහෝ ජනතා කොටස් ඩිමොක්‍රැටික් පක්ෂය දෙස බැලුහ. ලිබර්මාන් හැරුනු කොට අන් සියලු අපේක්ෂකයන් යුද විරෝධීන් ලෙස පෙනී සිටි අතර ප්‍රාථමික ඡන්දවල දී ඡන්දය දුන් බොහෝ දෙනා එක්තරා ආකාරයක උද්යෝගයකට පත්ව සිටියහ. එමෙන් ම බුෂ්ට විරුද්ධව නැග එන විරුද්ධත්වය කෙසේ හෝ එම පරිපාලනය අනුගමනය කරන පිලිවෙත් ප්‍රතික්ෂේප කිරීමකට තුඩු දෙනු ඇතැයි

විශ්වාස කලහ. සිදු වූයේ ඊට වෙනස් දෙයකි. ඩිමොක්‍රැටික් පක්ෂය මෙම සියලු පිලිවෙත් බදා වැලඳ ගෙන ඇත.

ඒ සමග ම සැප්තැම්බර් 11 දා ගැන කෙරෙන පරීක්ෂනය ත්‍රස්තවාදයට එරෙහි සටනේ නාමයෙන් The Patriot Act (ස්වදේශාල පනත) නීත්‍යනුකූල කිරීමේත් ශක්තිමත් කිරීමේත් ද්විපාක්ෂික ව්‍යායාමයක් බවට පත්ව ඇත. සැප්තැම්බර් 11 දායින් පැන නැගුනු සැබෑ ප්‍රශ්න -- එනම් මෙම සිද්ධිය මැද පෙරදිග යුද න්‍යාය පත්‍රය ශක්තිමත් කිරීමට ඉවහල් කර ගැනුනු ආකාරය -- ගැන කිසිදු පරීක්ෂනයක් පවත්වා නැත. පුදුමයකට මෙන් සීඅයිඒ හා එෆ්බීඅයි සංවිධාන එක්සත් ජනපදයේ ප්‍රජාතාන්ත්‍රික අයිතීන් කඩා බිඳ දැමීමේ ලා ඔවුන් ඇති තරම් ආක්‍රමනශීලී වීමට අපොහොසත් වීම ගැන විවේචන එල්ල විය.

සති හා මාස ගෙවී යන විට කම්කරු පන්තියේ හා ශිෂ්‍යයන්ගේ වඩාත් පුලුල් පිරිසකට තමන්ගේ ගැටලු කිසිවකට ආමන්ත්‍රනය නො කෙරෙන බව වඩාත් පැහැදිලි වනු ඇත. ඔවුන්ගේ ම දේශපාලන හා සමාජ අවශ්‍යතාවලට ඇමතිය හැකි රාමුවක් ද්විපක්ෂ ක්‍රමය සම්පාදනය නො කරයි. කර්මාන්තයේ අවපාත තත්වයකින් පමනක් නො ව උද්ධමනයේ සැලකිය යුතු වැඩි වීමකින් සංලක්ෂිත වන ඉහල නගින ආර්ථික අස්ථාවරත්වයක සන්දර්භය තුල මෙම දේශපාලන අර්බුදය දිග හැරෙමින් තිබෙන බව මීට එකතු කල යුතු ය. වඩාත් ම මෑත සංඛ්‍යා ලේඛන අනුව, නිල උද්ධමන අනුපාතය සියයට 5ක් වන අතර ඉන්ධන හා ආහාර මිල ගනන් දෙස බලන්නේ නම් තත්වය වඩාත් උග්‍ර බව පෙනී යයි.

ඇතැම් ආහාර ද්‍රව්‍යවල මිල මසක් තුල දෙගුන වී ඇතැයි *නිව් යෝක් ටයිම්ස්* පුවත්පත වාර්තා කරයි. මසක් තුල කිරි මිල සියයට 30කටත් වැඩි ප්‍රමානයකින් වැඩි වී ඇත. කම්කරුවන්ට තමන්ගේ මෝටර් රථවලින් වැඩට යාම සඳහා දරන්නට සිදුව ඇති යථා වියදම ජීවන තත්වයන්ගේ යෝධ කඩා වැටීමක් සලකුනු කරයි. ජීවන තත්වයන් මත ඇති කෙරෙන මෙම බලපෑම කම්කරු පන්තියේ පුලුල් කොටස් අතර රැඩිකලීකරනයක් ඇති කිරීමට නියමිත බව ගැන ප්‍රශ්නයක් නැත.

අපට මුහුන පෑමට සිදු විය හැකි පිරිස් බලය හා සම්පත් පිලිබඳ වත්මන් සීමාසහිත භාවයන් කොපමන වුව ද ඉදිරි දර්ශනයක හා විශ්ලේෂනයක පදනම මත -- එක්සත් ජනපදය තුල හා ජාත්‍යන්තරව ම තීව්‍ර වන දේශපාලනික, ආර්ථික හා සමාජ අර්බුදයේ කොන්දේසිවල පදනම මත -- අපි අපේ මැතිවරන උද්ඝෝෂනය ගොඩ නගන්නෙමු.

යලි අවධාරනය කිරීමට යි: ඩිමොක්‍රැටික් පක්ෂය වෙත මූලධර්මාත්මක විරුද්ධත්වයක කිසිදු බරපතල ඉදිරි දර්ශනයක් ප්‍රකාශයට පත් කිරීමට අසමත් හරිතයන් හා අන් සුලුධනේශ්වර කන්ඩායම් බඳු පෙර කල රැඩිකල්වාදීන්ගේ විශ්ලේෂනයට එරෙහිව අපේ විශ්ලේෂනයේ ශක්තිය දැනට මත් බෙහෙවින් පැහැදිලි වෙමින් තිබේ.

චිරප්‍රසිද්ධ විරුද්ධවාදී චොම්ස්කි මහතා ජෝන් කෙරීට ඔහුගේ සහයෝගය පල කරමින් සිටී. ඔහු කැමති වුවත් නැතත් ඔහුගේ වෘද්ධ සමය කෙලවර වන්නේ ඉරාකයට එරෙහි යුද්ධය එහි අන්තය දක්වා ගෙන යෑම තමන්ගේ අභිප්‍රාය බව මුලුමනින් විවෘතව කියා පාන උදවියගේ කඳවුර තුල ය.

ඊලගට ඇත්තේ නාඩර් මහතාගේ ශෝකජනක දසුන යි. ඔහු ජෝජ් බුෂ් පරාජය කිරීමේ හා ජෝන් කෙරී තේරී පත් වීම සහතික කිරීමේ වඩාත් ඵලදායී විධික්‍රමය ලෙස සිය අපේක්ෂකත්වය ආරක්ෂා කරමින් සිටී.

අපේ උද්ඝෝෂනය පෙරට යන්නේ මෙම පක්ෂ දෙක කෙරෙහි ම වූ සමහන් කල නො හැකි විරුද්ධත්වයේ පදනම මත ය. ඩිමොක්‍රැටිකයෝ වත් රිපබ්ලිකානුවෝ වත් ''අඩු'' නපුරක් නියෝජනය නො කරති. කම්කරුවන් වස බඳුන් අතරින් එකක් තෝරා ගත යුතු යැයි අපි යෝජනා නො කරමු.

පාලක පන්තිය සඳහා මෙම මැතිවරනය එහි ආර්ථික හා දේශපාලන න්‍යාය පත්‍රය වඩාත් ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීමට අවශ්‍ය ය යි හැඟෙන උපායාත්මක හැඩ ගැස්වීම් ඇති කර ගැනුමේ මාර්ගයක් පමනි. අවසන කෙටුම්පතක් හඳුන්වා දීම සිදු වන්නේ නම්, එය *නේෂන්* බඳු සියලු වර්නයන්ගෙන් යුත් ලිබරලුන්ගේ හා හිටපු රැඩිකලුන්ගේ සහයෝගය සහිත යුද්ධයට විරුද්ධව සිටි හිටපු වියට්නාම් යුද ප්‍රවීනයකු වූ ජනාධිපති කෙරී එය ඉදිරිපත් කිරීම වඩා හොඳ නැද්ද?

පසු ගිය මාසයේ අප කෙටුම්පත් කල ඉදිරි දර්ශනය සනාථ වී ඇත. සමාජවාදී සමානතා පක්ෂයේ මැතිවරන උද්ඝෝෂනය මහා ව්‍යාපාරික පක්ෂ දෙකේ අධිරාජ්‍යවාදී පිලිවෙත්වලට විරුද්ධව කම්කරු පන්තියට හා තරුනයන්ට එක ම මූලධර්මාත්මක විකල්පය ඉදිරිපත් කරයි.

© www.wsws.org